# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,147 — 1960 ජූනි 17 වැනි සිකුරාදා — 17.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... — — | 423 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... — | 429 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 430 | රට හීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බෑගිරුදිය විකිණීම — — | 438 | විවිධ දැන්වීම් — — — | 438 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක්ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීනු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීනුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය හා දක්‍ෂතාවයන් පිළිබඳ සහතික තුනක් ;

(ඈ) ඉහත සඳහන් අංක 7 දරණ තීරයේ කරුණු සනාථ කිරීම සඳහා සහතික.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### දෙවන පෙළ සැළසුම්කරු තනතුර

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දෙවන පෙළ සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින්ම පුරවා 1960 ජූලි 9 වන දින හෝ ඊට පෙර හෝ මෙම කාර්‍යාලයට ලැබෙන සේ "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

ස.ල.—ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "දෙවන පෙළ සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු වග දැනුම් දෙනු නො ලැබේ.

2. වැටුප්.—රු. 1,260 න් පටන් ගෙන රු. 120 සේ වාර්ෂික වැඩිවීම් 21 කින් රු. 3,780 දක්වා වැඩිවෙන වැටුපක් මෙම තනතුරට හිමිවේ. රු. 2,820 ට පැමිණීමට පෙර කාර්‍යක්‍ෂමතා කඩඉමක් ද වේ.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :—

(අ) පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ අරමුදලට දායක විය යුතුයි.

(ආ) පත්වීම තුන් අවුරුද්දක පරීක්‍ෂාවට භාජන වේ.

(ඇ) තෝරා පත් කරගත් අපේක්‍ෂකයා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

(ඈ) පරීක්‍ෂා කාලය ඇතුළත, ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීමට නුසුදුසු යැයි මෙහි පහත අත්සන් කරන්නාට හැඟේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

4. අවශ්‍ය සුදුසුකම් :—

(අ) 1960 ජූලි 9 වන දිනට අවුරුදු 21 ට නො අඩු හෝ අවුරුදු 30 නොවැඩි විය යුතුය.

(ආ) ගණිතය (රේඛා ගණිතය, වීජ ගණිතය ඇතුලු) එක් විෂයක් ලෙස ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ඇති බව.

(ඇ) අවුරුදු 2ක ආධුනිකත්වයක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ සැළසුම්කරුවන් පිළිබඳ අවුරුද්දක පූර්ණකාලීන අධ්‍යයනමාලාව හෝ ඒ සමාන තත්ත්වයේ වෙනත් අධ්‍යයන මාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයකු හෝ,

(ඈ) අවුරුද්දක ආධුනිකත්වයක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන් පිළිබඳව අධ්‍යයන මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයෙකු හෝ,

(ඉ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ චාටර්ඩ් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතෙහි අවුරුදු 4 ක නිත්‍ය ආධුනිකයෙකු වශයෙන් සේවය කොට, අවුරුදු 3 කාලයක් ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණීන්හි පස්වරු පංති වලට පැමිණි අයෙකු හෝ (මේ සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන් රු. 1,620 ක වාර්ෂික පටන් ගැන්මේ වැටුපකට හිමි ය.)

(ඊ) 1947 ට පෙර ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ දෙවැනි පෙළ සමත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සැළසුම්කරුවකු වශයෙන් අවුරුදු 2 කට වැඩි කාලයක් සේවය කළ අයෙකු හෝ,

(උ) අවුරුදු 5 ක කාලයක් සැළසුම්කරුවෙකු වශයෙන් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ චර්ටඩ් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ සේවය කළ අයෙකු බව, හෝ, ඔප්පු කිරීමට සුදුසු සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුයි.

(ඌ) මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුයි.

5. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පිටපත් පමණක් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය,

(ඇ) කාර්මික සහ වෘත්තීය සහතිකය,

(ඈ) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

6. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරු වලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

7. මෙම නිවේදනයේ ප්‍රකාර නො වන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වී. ඇන්. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1960 ජූනි මස 11 වැනිදා, කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

### බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැළසුම්කරු තනතුර සඳහා ඉල්ලුම් කිරීම

(ස.ල.—එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නො එවනවාත් හැර නැපැලේ නැතිවන සහතික ගැන දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :————.

   නම :—

   වාසගම :—

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය හා 60.7.9 දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුයි.)

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය :—

   (අ) අයදුම්කරුගේ පියා :————.

   (ආ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

   (ආ) ඔබ ලාංකිකයෙක් ද යන වග :————.

   (i) උත්පත්තියෙන් ද :————.

   (ii) නැත්නම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද :————.

7. කසාද බැඳලා ද නැද්ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :————.

   (අ) සිංහල :————.

   (ආ) දෙමළ :————.

   (ඇ) ඉංග්‍රීසි :————.

   (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි)

9. කාර්මික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

10. දැනට රක්‍ෂාවක් තිබේ නම් එය: ————.

11. චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් හා ලිපිනයන් :————.

12. පාසලින් අස්වූ දා සිට කරන ලද රැකියාවන් :————.
    (ස්වාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුයි.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### ගම් වගාකිරීම පුහුණුවන නිලධාරි තනතුර

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගම් වගාකිරීම පුහුණුවන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1960 ජූලි මස 8 වැනි දිනට හෝ ඊට ප්‍රථම අංක 42, ඇඩින්බරෝ චන්ද්‍රවංක, කොළඹ 7, ගොවිජන සේවා කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

2. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු දින හතක් ඇතුළත ඉල්ලුම් පත්‍රයක් ලැබුණු බව හැඟවීමේ දැනුම්දීමක් නොලැබුණහොත් වහාම ගොවිජන සේවා කොමසාරිස් වෙත ඒ බව දැන්විය යුතුය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකරන යම්කිසි ඉල්ලුම් කරුවෙකු ඇත්නම් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් කිසිවකට අහිමි වනවා ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :

සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් සුදුසුකම් තිබෙන බව ඔප්පු කළ යුතුය :—

(අ) 1960 ජූනි 1 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 18කට අඩු නොවිය යුතු අතර අවුරුදු 25කට වැඩි නොවිය යුතුය.

(ආ) ඔහු ශුද්ධ ගණිතය සම්මාන සහිතව සහ පහත සඳහන් වැඩ වලින් එකකින් සම්මාන සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටිය යුතුයි :—

ව්‍යවහාරික ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
තෘණ විද්‍යාව
භූගෝල ශාස්ත්‍රය.

සම්මාන ලබා තිබිය යුත්තේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් ය.

4. සේවයේ කොන්දේසි :

(අ) පොරොන්දුව :—පුහුණුව ලබන්නකු තෝරාගත් පසු ඔහු විසින් පළමු වැනි සහ දෙවැනි අවුරුදු වලදී උද්‍යෝගයෙන් සහ කීකරුවද පුහුණුවීම කරගනයන බවට සහ පුහුණු වීම අවසාන වූවාට පසු ගම් වගාකිරීම් නිලධාරියකු වශයෙන් හතර අවුරුද්දක් රජයට සේවය කරන බවට පොරොන්දු පත්‍රයකට ඇතුලත් විය යුතුය. පොරොන්දුව ක්‍රියා කරවීමට හැකිවන සේ දෙමව්පියන් හෝ භාරකාරයා ප්‍රධානියා හැටියට සහ තවත් දෙදෙනකු ඇප කරුවන් වශයෙන් රු. 3,000 ක ඇප ඔප්පුවකට ඇතුලත් විය යුතුය.

(ආ) පුහුණුවීම.—1960 ජූලි මස මැදබාගයෙන් පටන්ගෙන අවුරුදු දෙකක පුහුණුවීමේ කාලයක්වේ. එය මෙසේ ය :—

(i) වාරිමාර්ග සම්පාදනය පිළිබඳ 1960 ජූලි මස මැද බාගයෙන් පටන්ගෙන කාර්මික විද්‍යාලයේ අවුරුද්දක් ;

(ii) වාරි මාර්ග සම්පාදනය පිළිබඳ හය මසක ක්ෂෙත්‍ර පුහුණුවක් ;

(iii) ගොවි කර්මාන්තය පිළිබඳ ගොවිකම් දෙපාර්ත මේන්තුවේ හාර මසක පුහුණුවක් ;

(iv) පාලන කටයුතු පිළිබඳ දෙමසක පුහුණුවක්.

(ඉ) ගම් වගාකිරීම් නිලධාරි තනතුරට පත්වීම—ඉහත (ආ) උප ඡේදයේ සඳහන් පරිදි පුහුණුවීම සම්පූර්ණ කළායින් පසු ඇබෑර්තු ඇතිවන අන්දමට පුහුණුවූවකු ගම් වගාකිරීම් නිලධාරියකු ලෙස පත් කිරීමට සුදුසු වනවා ඇත. ඔහුව ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට මාරු කරනු ලැබේ.

5. වැටුප් :

(i) තෝරාගත් පුහුණුවන්නකුට මෙහි 4 වෙනි ඡේදයේ (ආ) කොටසේ ප්‍රකාර පුහුණුව ලබන අවුරුදු දෙක තුලදී ආණ්ඩුවේ නියමිත ජීවන වියදම, විශේෂ ජීවන වියදම ඇතුළත් රු. 660 ක වාර්ෂික දීමනාවක්ද ගෙවනු ලැබේ.

(ii) ගම් වගාකිරීම් නිලධාරියකු සේ පත් වූවාසින් පසුව රු. 1,260—120—රු. 3,300 වාර්ෂික වාටුපක් ලැබේ. (රු. 2,340 සහ රු. 2,940 ට ප්‍රථම කාර්යක්ෂමතාව කඩඉම).

6. මේ තනතුරු සව්රය, විශ්‍රාම වැටුප් සහිතය.

7. රජයේ සේවයේ නියුක්ත අයදුම් කරුවන් විසින් එවනු ලබන අයදුම්පත් කායඝී සංවිධාන සංග්‍රහයේ 109 වැනි ඡේදය අනුව ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළ වී ඇති රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

9. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම් කරුවන් විසින් පහත සඳහන් ඇ වල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(i) උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iii) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික පත් දෙකක්.

සී. ජී දයාරත්න,
ගොවිජන සේවා කොමසාරිස්.

1960 ජූනි 13 දින,
කොළඹ.

## ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ ගම් වගාකිරීම පුහුණුවන නිලධාරි තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය :————.

4. අධ්‍යාපනික සුදුසු කම්—

විභාග සමත් වූ මාසය :————.

අවුරුද්ද සහ වැඩවලද විස්තර සහිතව :————.

5. දැනට රක්ෂාවක් තිබේ නම්, එය :————.

6. චරිතය පිළිබඳ සහතික පත්‍ර ලබාගත් අයගේ නම් :————.

————,
අයදුම් කරුගේ අත්සන.

————.
දිනය.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සැළසුම්කරු තනතුරක්

කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ඉංජිනේරු සැළසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

**2. වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 1,620—120—රු. 3,780ක් වේ.

**3. සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම අවුරුදු 3ක පරීක්ෂා කාලයකට යටත්වේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) වයස අවුරුදු 35 කට වැඩි නොවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවා තනතුරුවල නියුක්තව සිටින්නන් කෙරෙහි මෙම වයස සීමාව බල නොපායි).

(ආ) ගණිතය සමඟ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

(ඇ) (i) ලංකා කාර්මික විද්‍යාලයේ දිවා භාගයෙහි පැවැත්වෙන සැළසුම්කරුවන් පුහුණු කිරීමේ එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය, හෝ

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකයන් පුහුණු කිරීමේ දෑවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) පිළිගත් සැළසුම් කාර්යාලයක පහත සඳහන් අයුරු ආධුනික කාල සීමාව සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය. එනම්—

1. (ඇ) (i) දරණ වගන්තියෙහි දක්වෙන සුදුසුකම් ඇත්තවුන් අවුරුදු 2ක ආධුනික කාල සීමාවක් ද,

2. (ඇ) (ii) දරණ වගන්තියෙහි දැක්වෙන සුදුසුකම් ඇත්තවුන් එක් අවුරුද්දක ආධුනික කාලසීමාවක්ද සම්පූර්ණ කොට තිබිය යුතුය.

(ඉ) (ඇ) වගන්තියෙහි දක්වා ඇති ආධුනික කාලසීමාව සම්පූර්ණ කිරීමෙන් පසුවද සැළසුම් කාර්යාලයක අවුරුද්ද කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ඊ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

5. සිය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපත (**සැළකිය යුතුය.**—බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍රය හෝ පිළිගනු නොලැබේ.)

(ii) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පිළිබඳ උසස්තම සහතික පත්‍රවල පිටපත්.

(iii) මෑතදී ලබාගත් චරිත සහතිකපත්‍ර 3ක පිටපත් (මෙම උප වගන්තිය යටතේ දැනටමත් රජයේ සේවාවේ නියුක්ත අපේක්ෂකයින්ගේ චරිත සහතික පත්‍ර අපේක්ෂා කරනු නොලැබේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසිද කියවා බලන්න.

7. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවනසේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර 1960 ජූලි මස 1 වැනි දින හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකම් අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන සේ එවිය යුතුයි. එවැනි ඉල්ලුම් පත්‍ර කෘෂිකම් අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික නමට නො එවිය යුතුයි. මේ සඳහා විශෙෂ ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

ඒ. ඩී. ඊවඩ්ස්,
වැඩබලන කෘෂිකම් අධ්‍යක්ෂක.

කෘෂිකම් දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය, 1960 ජූනි මස 7 වෙනි දින දීය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව—පේරාදෙණිය

**ඉංජිනේරු සැළසුම්කරු තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා 1960 ජූලි මස 1 වැනි දිනට වයස :————.
4. ජතිය :————.
5. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(අයදුම්කරු ලංකාවේ උපත ලබා සිටිනම් (අ) වගන්තිය ඇතුළු (ආ) වගන්තිය හෝ (ඇ) (ඈ) වගන්ති දෙකද පිරවිය යුතුය.)

(අයදුම්කරු ලංකාවේ උපත නොලැබුවේ නම් (ආ) හා (ඇ) වගන්තිය හෝ (ඇ) හා (ඈ) වගන්තිය හෝ පිරවිය යුතුය.)

6. අයදුම්කරු ලියාපදිංචිවීමෙන් හෝ පරම්පරාවෙන් හෝ ලංකා පුරවැසිකම ලබා තිබේද ? :————.
7. අධ්‍යාපන සුදුසුකම් :————.
8. මෙම ගැසට් දන්වීම් පත්‍රයේ 4 වැනි ඡේදය අනුව ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් :—
   4. (ඇ) (i) හෝ (ii) :————.
   (ඈ) :————.
   (ඉ) :————.
9. වෙනත් සුදුසුකම් හෝ ඉංජිනේරු සැළසුම්කරුවෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද :————.
10. දැනට රක්ෂාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. කලින් කළ රක්ෂාවල් හා ඒ පිළිබඳ විස්තර :————.
12. චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බාලාංශ පන්ති පිළිබඳ පරීක්ෂිකා තනතුරු**

මෙහි පහත දක්වෙන 4 වැනි ඡේදයේ සඳහන් වූ කොන්දේසි තෘප්ත කරන අපේක්ෂිකාවන්ගෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බාලාංශ පන්ති පිළිබඳ පරීක්ෂිකා තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ පෝරමය අනුව ඉල්ලුම් පත් පිළියෙල කොට, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, පාලන අංශයේ, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත 1960 ජූලි මස 15 වැනි දිනට කලින් ලැබෙන්ට එවිය යුතුයි.

**2. වැටුප.**— මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 2,580න් පටන්ගෙන රුපියල් 120 වාර්ෂික පඩි වැඩිවීම් 11 කින් හා රුපියල් 180 වාර්ෂික පඩි වැඩිවීම් 5කින් රුපියල් 4,800 දක්වා නඟී. රුපියල් 3,300 වාර්ෂික වැටුපට හා රුපියල් 4,080 වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉම් වේ.

**3. සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**— (1) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිත ය. තෝරාගත් අයදුම්කරුවන් දැනටමත් රජයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක ස්ථිර කර නැත්නම්, තුන් අවුරුදු සේවා පරීක්ෂණයකට යටත්ව පත් කරනු ලැබේ.

(ii) අයදුම්කරු තවදුරටත් සේවයෙහි යෙදීමට නුසුදුසු බව ආධුනික කාලසීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, වැඩ බලන කාලසීමාව ඇතුළත හෝ, ආධුනික කාලසීමාව ඇතුළත හෝ, එම කාලසීමාව අවසානයේ කලින් දරූ තනතුරට නැවත පත්කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් තනතුරක් දරන්නකු නොවේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) පරීක්ෂිකාවන් ස්ථිර කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වෙන පරීක්ෂණයකදී තමා වැඩ කරන භාෂාවෙන් සමත් විය යුතු ය. මෙම පරීක්ෂණය පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාග තත්ත්වය පමණ වනු ඇත. මෙහි ඉහත සඳහන් පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රවලට සමාන හෝ ඊට ඉහළ තත්ත්වයක් ඇතැයි අධ්‍යාපන අධ්‍යක්ෂ තැනට හැඟෙන තත්ත්වයක් ඇති පරීක්ෂණයකදී හෝ වැඩ කරන භාෂාවෙන් සමත් වී සිටින පරීක්ෂිකාවන් ඉහත සඳහන් සුදුසුකමෙන් නිදහස් කරනු ලැබේ.

(iv) මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් රුපියල් 3,300 කාර්යක්ෂමතා කඩඉමට පෙර, අධ්‍යාපන පිළිබඳ නීති විභාගයකින් සමර්ථ විය යුතුය.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(i) දැනට රජයේ සේවයෙහි යෙදී නැත්නම්, 1960.7.15 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු බව සහ අවුරුදු 40ට නො වැඩි බවටද,

(ii) පුහුණු වූ පළමුවැනි පෙළ ගුරු සහතික පත්‍රය හා එය ලැබීමෙන් පසු තුන් වර්ෂයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති බවට, හෝ

නුපුහුණු වූ පළමුවැනි පෙළ ගුරු සහතික පත්‍රය හා එය ලැබීමෙන් පසු පස්වසක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති බවටද,

(iii) ළදරු අධ්‍යාපනය පිළිබඳව නවීන ක්‍රම ගැන මනා දැනීමක් ඇති බවටද,

(iv) සංගීතය, රිත්මානුකූල ව්‍යායාම හා ගැයීම පිළිබඳව දැනීමක් ඇති බවටද,

(v) සිංහල භාෂාවේ මනා දැනුමක් ඇති බවටද,

(vi) මනා කල් ක්‍රියාවෙන් හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත වූ බවටද,

සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය.**—බාලාංශ වැඩ පිළිබඳ පිළිගත් සහතිකයක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් වන සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතික පත්‍ර හෝ පිළිගනු නො ලැබේ.),

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතික පත්‍ර,

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ).

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නො ලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයින්ගේ ඉල්ලුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. රජයේ අභ්‍යාස විද්‍යාලයවල, මධ්‍ය මහා විද්‍යාලයවල, මහා විද්‍යාලයවල හා විද්‍යාලයවල ගුරුවරියන් සිය ඉල්ලුම් පත්‍ර විද්‍යාලයාධිපති මඟින් එවිය යුතු ය. විද්‍යාලයාධිපති විසින් එම ඉල්ලුම් පත්‍ර නියමිත අන්දමට යෙදෙන පරිදි මේ දෙපාර්තමේන්තුවේ ඊ. සී. හෝ ජී. ඊ. ශාඛා මඟින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කළ යුතු ය.

7. මුද්‍රිත අයදුම්පත් නොමැත. මෙහි පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍ර අනුව ඉල්ලුම් පත් පිළියෙල කර ගත යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත්කිරීම් සඳහා අදාල වන පොදු කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

9. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාරගැනීම අවසන් කොට දින 3ක් ඇතුළත එසේ දන්වා එවනු නො ලැබූ අයදුම්කරුවන් ඒ බව වහාම පරිපාලන ශාඛාවේ අධ්‍යාපනාධ්‍යක්ෂ තැනට දන්වා එවිය යුතු ය. මෙම නියමය නො පිළිපැදීම අයදුම්කරුවකු සැලකිල්ලට භාජනවීමට ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

ඒ. බී. කේ. 1386,
1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ ආකෘති පත්‍රය

**බාලාංශ පන්ති පිළිබඳ පරීක්ෂිකා තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් :————.
2. ලිපිනය :————.
3. 1960.7.15 දිනට නියම වයස : අවුරුදු ..........., මාස ......... දින .........
4. ජාතිය හා ලාංකිකයකු වූ අන්දම :————.

5. පහත දක්වෙන අය උපන් සථාන :—

(අ) අයදුම්කරු :————.

(අ) ඇගේ පියා :————.

(ඉ) ඇගේ පිය පාශීවයේ මුත්තා :————.

(ඊ) ඇගේ පිය පාශීවයේ මී මුත්තා :————.

6. (අ) පළමුවැනි පෙළ පුහුණු වූ ගුරු සහතික පත්‍රය හෝ පළමුවෙනි පෙළ නුපුහුණු ගුරු සහතික පත්‍රය ලබා තිබේද ? (එසේ නම් එහි අංකය හා දිනය සඳහන් කළ යුතුය.) ————.

(ආ) බාලාංශ වැඩ පිළිබඳ පිළිගත් සහතිකයක් හෝ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබේද ? :————.

(ඉ) ළදරු අධ්‍යාපනය පිළිබඳව ලබා ඇති දැනීම :————.

(ඊ) සංගීතය රිත්මානුකූල ව්‍යායාම, ගැයීම පිළිබඳ දැනුම : ————.

(උ) ලබා ඇති වෙනත් සහතික පත්‍ර :————.

(ඌ) ඉගැන්වීමේ පළපුරුද්ද

| පාඨශාලාවේ හෝ ආයතනයේ නම | දූරු තනතුර | දූරු සහතික පත්‍රය | බැඳුනු දිනය | අස් වූ දිනය | කාල සීමාව | | අස් වීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අවු. | මා. | |
| | | | | මුළු සේවය | | | |

7. පහත සඳහන්, භාෂාවන් පිළිබඳ දැනුම :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඉ) ඉංග්‍රීසි :————.

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල :————.

9. දැනට කරන රැකියාව විස්තර සහිතව :————.

10. දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩි වීමේ දිනය :————.

11. චරිත සහතික දුන් අයගේ (නෑදෑයන් නොවේ) නම් හා තනතුරු (චරිත සහතික පිටපත් තුනක් (මුල් පිටපත් නොවේ.) ඇමිණිය යුතුය.) රජයේ සේවකයන්ගෙන් මෙය අනවශ්‍යය ය :————.

12. වෙනත් තොරතුරු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ පත්කිරීම සඳහා තෝරා ගැනීමට කලින් එළිදරව් වුවහොත්, මා නුසුදුස් සකුවීමටත්, පත්කිරීමෙන් පසු එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත්වන බව මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ගුවන් විදුලි දෙපාර්තමේන්තුව

### විදුලි බලාගාර අධිකාරි තනතුර

ගුවන් විදුලි, දෙපාර්තමේන්තුවේ විදුලි බලාගාර අධිකාරි තනතුරක් සඳහා දැන් ඉල්ලුම් පත් භාරගනු ලැබේ. මෙම දැන්වීමේ පාමුල ඇති ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත්, 1960 ජූලි මස 1 වැනි දින නොඉක්මවා ලැබෙන සේ, ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්, ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7 යන ලිපිනයට එවිය යුතුයි. ඉල්ලුම් පත් ආකෘති වෙනම සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "විදුලි බලාගාර අධිකාරි තනතුර" යන්න සඳහන් කළ යුතුයි.

**2. වැටුප්, වෙනත් දීමනා හා සේවා කොන්දේසි.**—තෝරා ගත් අයදුම්කරුවාගේ සුදුසුකම හා පළපුරුද්ද අනුව රු. 1,860—120—රු. 3,720ක වාර්ෂික වැටුප් ක්‍රමයක් හෝ රු. 3,900—180—රු. 5,340ක වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරට හිමිවේ.

**3. පත්කිරීමේ කොන්දේසි.**—(1) තනතුර තාවකාලිකය.

(2) මෙම තනතුරට පත්කරනු ලබන තැනැත්තා ඒ කල විදුලි බලාගාරයත්, ටොරිංටන් චතුරශ්‍රයේ හා මැනින් ටවුමේ පිහිටි විදුලි බල යන්ත්‍ර හා ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි වායු සමීකරණ යන්ත්‍ර යත් භාරව කටයුතු කළ යුතුයි. දෙපාර්තමේන්තුවේ රියවාහන නඩත්තුව සම්බන්ධයෙන්ද වගකිව යුතු ඔහු ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නියම කරන අනෙක් රාජකාරි වෙතොත් එය ද ඉටු කළ මනා වේ.

**4. සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙකුම පහත සඳහන් කරුණු ස්ථුට කෙරෙන සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 ජූලි මස 1 වැනි දිනට වයසින් අවුරුදු 25ට නොඅඩු හා 45ට නොවැඩි බව,

(ආ) (1) ගණිතය සහ භෞතික විද්‍යාව හෝ යාන්ත්‍රික විද්‍යාව හෝ රසායනික විද්‍යාව හෝ විෂයයන් වශයනෝ ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් බව, තවද

(2) විදුලි ඉංජිනේරු අභ්‍යාසය (ඒ සී හා ඞී සී මාධ්‍ය ශ්‍රේණිය) පි...බඳව සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ඔෆ් ලන්ඩන් ඉන්ස්ටිටියුට් සහතිකය සතු බව,

(ඇ) විශාල ඩීසල් විදුලි බල යන්ත්‍ර, විශේෂයෙන් "mirrlees" විසින් සාදන ලද වර්ග, ක්‍රියා කරවීමේ හා නඩත්තු කිරීමේ පළල් දැනුමක් හා පළපුරුද්දක් ඇති බව,

(ඈ) සාමාන්‍ය යාන්ත්‍රික කර්මාන්ත ශාලා වැඩ පිළිවෙල ගැන මනා දැනුමක් හා පරිචයක් ඇති බව,

(ඉ) විදුලි ඉංජිනේරු අභ්‍යාසයේ මනා දැනුමක් ඇති බව,

(ඊ) සේවක මණ්ඩලයක් පාලනය කළ හැකි බව,

(උ) මනා චරිතයකින් යුක්ත වූවකු බව, සහ

(ඌ) පරිපාලක තනතුරක පස් අවුරුද්දක පළපුරුද්දක් ඇති බව. ලොකු, කුඩා වායු සමීකරණ උපකරණ ක්‍රියා කරවීමේ හා නඩත්තු කිරීමේ පළපුරුද්දක් ඇත්නම් එය විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

5. තෝරාගනු ලබන අයදුම්කරු විසින් (යථා කාලයේදී දන්වනු ලබන ප්‍රමාණයක) ඇප මුදලක් මුදලින් හෝ ඇපකාර සමාගමක් මගින් හෝ තැන්පත් කළ යුතු වේ.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි පිටපත් (මුල් ලියවිලි නොව) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියාපදිංචි නොකළ අය සම්බන්ධයෙන්) රෙජිස්ත්‍රා ජනරාල් විසින් නිකුත් කරන ලද විශේෂ වයස් සහතිකය.

(2) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, දක්ෂතාවය හා පත්වීම දීමට යෝග්‍යත්වය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක්. (දැනට ම රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් මේ උප-ඡේදය යටතේ සහතික නොඑවුවමනාය.).

(3) තමන් ලබාගත් උසස්ම කාර්මික හා අධ්‍යාපනික සුදුසුකම් දක්වෙන සහතිකය.

**සැලකියයුතුයි.**—මේ සහතික පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නොලැබේ. මුල් පිටපත් එවිය යුත්තේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එවිටය.

7. නියමිත දින ඉක්මවා මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවකයින්ගේ ඉල්ලුම්පත්, සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට කල් ඇතිව ලැබී ඇත්නම් හා එය පිළිගන්නා මෙන් වලංගු හේතු දක්වමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් මිස, පිළිගනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ මුල දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි බලන්න.

9. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධ සෙසු ලියකියවිලි එවිය යුත්තේ ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් නමට මිස, මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

10. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

පී. ඊ. ගුණරත්න,
ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්.

1960 ජූනි 17 දින,
කොළඹ 7, ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේදීය.

### අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

#### විදුලි බලාගාර අධිකාරි තනතුර

(1) සම්පූර්ණ නම (අච්චු අකුරෙන් ලියන්න) :—

(අ) වාසගම (හෙවත් අගට යෙදෙන නම) :————.

(ආ) සෙසු නම් :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) (අ) 1960 ජූලි මස 1 දිනට යෙදෙන නියම වයස— අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය (උප්පැන්න සහතිකයේ හෝ විශේෂ වයස් සහතිකයේ පිටපත ඇමිණිය යුතුය.) :————.

(4) ජාතිය :————.

(1) ලාංකිකත්වය පෙළපතින්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.

(2) ලාංකිකත්වය පෙළපතින් නම් පහත සඳහන් අය උපන් තැන සඳහන් කරන්න—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් :————.
(4 (3) (1) උප ඡේදය යටතේ අවශ්‍ය සහතික පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුය.)

(6) කාර්මික සුදුසුකම් (සහතික පිටපත් අමුණා එවිය යුතුය) : ————.

(7) එවා ඇති චරිත සහතික සැපයූ අයගේ නම් හා ලිපින : ————.

(8) යුද සේවයේ යෙදී සිටි අය වෙනුවෙන් පැවරෙන අනුග්‍රහය බලාපොරොත්තු වන්නේද යන වග (එසේ නම් යුද සේවයෙන් අස්කිරීමේ ලිපිය හෝ එවැනි වෙනත් සාක්ෂ්‍යයක් සැපයිය යුතුය) :————.

(9) සේවයට තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු විශේෂ සුදුසුකමක් පළපුරුද්දක් ඇත්නම් එහි විස්තර (4 වැනි ඡේදය බලන්න) :————.

(10) රජයේ සේවයේ කිසි විටෙක යෙදී ඇත්නම් ඒ කවදා කොතැනද යන වග :————.

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් රියදුරන්ගේ තනතුරු

### ශුද්ධිය

1960 මැයි මස 20 වැනි දින අංක 12,133 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි I වැනි කොටසේ (II) වැනි ඡේදයේ 344 වැනි පිටුවෙහි පළවූ නිවේදනය කෙරෙහි සැලකිල්ල යොමු කරන අතර, ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කරන්නවුන්ගේ වැඩිම වයස් සීමාව, එම දැන්වීමෙහි වැරදීමකින් සඳහන්වන පරිදි අවුරුදු 25 නොව අවුරුදු 30 යනුවෙන් නිවැරදි විය යුතු බැව් මෙයින් දන්වමි.

මො. වි. පො. අබයකෝන්,
පොලිස්පති.

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සමුපකාර දෙපාර්තමේන්තුව

**සමුපකාර සමිතිවල කළමනාකරුවන් හෝ ලේකම්වරුන් වශයෙන් සේවය කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පුහුණු කිරීම**

ඉහත දක්වෙන අභ්‍යාස පංතියට ඇතුල්වීම ආපක්ෂා කරන අයදුම්කරුවන් විසින් ඒ සඳහා නියමිත ආකෘති පත්‍ර සමුපකාර විද්‍යාලයාධිපති තැනගෙන් හෝ අයදුම්කරු පදිංචි වී සිටින දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තැනගෙන් හෝ, ලබාගෙන 1960 ජූලි මස 23 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස " සමුපකාර විද්‍යාලයාධිපති, සමුපකාර විද්‍යාලයය, පොල්ගොල්ල" යන ලිපිනයට එවන මෙන් ආරාධනය කරනු ලැබේ.

**අභ්‍යාස පංතිය පැවැත්වෙන කාල සීමාව.**—1960 සැප්තැම්බර් 20 වැනි ද සිට 1960 දෙසැම්බර් 20 වැනි ද දක්වා.

**උගන්වන විෂය මාලාව.**—සමුපකාරය, පොත් තැබීම, ලේකම් පුහුණුව, විකුණුම් ශාස්ත්‍රය හා පරිපාලනය.

**අභ්‍යාස පංතියට ඇතුළත් කරගැනීමට අවශ්‍ය සුදුසුකම්.**—1960 ජූලි 23 වැනි දිනට වයස අවුරුදු 18 ට වැඩි වූද, අවුරුදු 40 ට අඩු වූද, පහත දක්වෙන අතිරේක සුදුසුකම් ඇත්තා වූද, ඕනෑම කෙනෙකුට මේ පංතියට ඇතුළත් වීමට ඉල්ලා සිටිය හැකි ය.

**අතිරේක සුදුසුකම් :—**

(1) සිංහල, දෙමළ හෝ ඉංග්‍රිසි කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබසිටීම ; හෝ

(2) ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක කළමනාකරුවෙකු, ලේකම්කෙනෙකු, ගණන් තබන්නෙකු හෝ ගණන් තැබීමේ ලිපිකරුවෙකු වශයෙන් මාසික වේතනයක් ලබමින් දවුරුද්දක් හෝ, එයට වැඩි කාලයක් තිස්සේ නො කඩවා සේවය කර තිබීම ; හෝ

(3) 1950 සිට 1957 දක්වා කාලය තුළ සමුපකාර විද්‍යාලයය මගින් පැවැත්වුණු සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍ර විභාගයෙන් සමර්ථ වී සිටීම ; හෝ
ව්‍යාප්ති අංශය මගින් සති අන්තයේ පවත්වන සේවක පුහුණුවීමේ පංති අවසානයේ පරීක්ෂණ විභාගයෙන් " සමුපකාරය " හා " ගණන් තැබීම " යන විෂයයන්ගෙන් සමර්ථ වී සිටීම.

**අභ්‍යාස පංති පැවැත්වෙන මධ්‍යස්ථාන :—**

(අ) පොල්ගොල්ල, මීගමුව, ගාල්ල, කුරුණෑගල, රත්නපුර, බණ්ඩාරවෙල, අනුරාධපුර සහ මඩකලපුව යන ප්‍රදේශයන්හි පිහිටුවා ඇති ප්‍රාදේශීය සමුපකාර අධ්‍යාපන මධ්‍යස්ථාන, (එක මධ්‍යස්ථානයකට ඇතුල්කර ගන්නා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. මේ මධ්‍යස්ථානවලට ඇතුල් වීම අපෙක්ෂා කරන අයදුම්කරුවන් එම පළාතේ පදිංචි හෝ සේවයේ යෙදී සිටින අය විය යුතු ය.)

නේවාසික පහසුකම් සපයනු නො ලැබේ. මඩකලපුව හැර අනෙක් සියළු ම මධ්‍යස්ථානයන්හි පංති පැවැත්වෙන්නේ සිංහල භාෂාවෙන් පමණකි. මඩකලපුවේ පංති පැවැත්වෙන්නේ දෙමළ භාෂාවෙනි.

(ආ) මෙපමණක් නොව යාපනේ සමුපකාර මහා සංගමය විසින් යාපනේ සමුපකාර අභ්‍යාස පාඨශාලාවේදී ද, සමස්ත ලංකා සමුපකාර මහා සංගමය විසින්, කොළඹ, හලාවත, මාතර, කෑගල්ල, කළුතර හා මන්නාරම යන ස්ථානවලදී ද මෙ බඳු පංති පවත්වනු ලැබේ. එම පංතිවලට ඇතුළත්වීම අපෙක්ෂා කරන අයදුම්කරුවන් විසින් ඒ ඒ ආයතනයන් වෙත අයදුම් කළ යුත්තේ අයදුම්කරුවන් කැඳවන බැව් පුවත්පත් නිවේදනයකින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රසිද්ධ කිරීමෙන් පසුව ය.

**පුහුණුවන්නවුන් තෝරා ගැනීම.**—පුහුණු වන්නවුන් තෝරා ගැනීම සඳහා එක් එක් මධ්‍යස්ථානයේදී ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම නිසා ඉල්ලුම් පත්‍ර එවීමේදී ප්‍රවේශම් විය යුතු ය. නියමිත සුදුසුකම් ඇති ආධුනිකයින් පමණක් ඉල්ලුම් පත්‍ර එවිය යුතු ය. පරීක්ෂණ ගාස්තුව වශයෙන් රුපියල් 2 ක පෝස්ටල් ඕඩරයක් " සමුපකාර මහා සංගමය, කොළඹ " නමට ගෙන තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතු යි. සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ. ගමන් ගාස්තු ගෙවනු නො ලැබේ.

**ගාස්තු.**—ඉගැන්වීම සඳහා කිසිම මුදලක් අය කරනු නො ලැබේ. අභ්‍යාසය අවසානයේ පැවැත්වෙන විභාගයට පෙනී සිටින අයදුම් කරුවන්ගෙන් රුපියල් 2.50 ක විභාග ගාස්තුවක් අය කරනු ලැබේ.

**විභාගය හා සහතික පත්‍රය.**—අභ්‍යාස කාලය අවසානයේ දී පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වූ අයදුම්කරුවන් ට " සමුපකාර සේවකයින් ගේ සහතික පත්‍රය " ප්‍රදානය කරනු ලැබේ.

**රක්ෂා ලැබීමේ අපෙක්ෂාව.**—මෙම සහතිකය ලැබූ අයට රක්ෂා සපයා දීමට සමුකාර දෙපාර්තමේන්තුව බැඳී නැත.

සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර් තැන.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/7 (ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1959යේ මාර්තු

වර්ෂ 1960ක්වූ මැයි මස 20 වැනි දිනය හා අංකය 12,133 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, වර්ෂ 1960ක්වූ මැයි මස 7 වැනි දිනය දරණ නිවේදනය හා සම්බන්ධයි. වර්ෂ 1959 ක්වූ මාර්තු මස 28 වැනි දින පවත්වනු ලැබූ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් සහ අපේක්ෂිකාව ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කර ගැනීමට තෝරා ගනු ලැබූ බැව් මෙයින් දන්වමි :—

| නම | | ලිපිනය |
|---|---|---|
| ප්‍රනාන්දු, පී. එල්. | ... | 343, මොරටුමුල්ල, මොරටුව. |
| ලියනපතිරණ, ඩී. | (මෙනෙවිය) | වැවහමන්දුව, මාතර. |
| සැම් එච්. ඩබ්ලිව්. | ... | ජී. සේනාධීර මහතා බාරේ, 88/2, ගාලු පාර, දෙහිවල. |

2. ඉහත සඳහන් අපෙක්ෂකයින්ට සහ අපේක්ෂිකාවට පත්වීම් වහාම දීමට ආණ්ඩුව භාරගන්නේ නැත. නමුත් ඇබෑර්තු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. අපෙක්ෂකයන් තුන් අවුරුදු අස්ථිර පත්වීම් ඇතිව ද, අපෙක්ෂිකාව තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවක් සහිතව ද පත් කෙරෙනු ඇත. සියළු අපේක්ෂක අපේක්ෂිකාවන් විසින් ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික

තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්‍ෂණයකින් සාමර්ථ්‍ය ලැබිය යුතුයි. තවද, ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලටද යටත් වෙනවා ඇත.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ක්වූ ජූනි මස 13 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කාර්‍යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය (සිංහල)—1960වේ අප්‍රේල්

වර්ෂ 1960වේ අප්‍රේල් මස 23 වැනි දින පවත්වනු ලැබූ ඉහත සඳහන් පරීක්ෂණයට පෙනී සිටි අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් කිසිවෙක් ඔවුන් විසින් පෙනී සිටි කිසිම විෂයයකින් සාමාර්ථය ලබා නැති බැව් මෙයින් දනුම් දෙමි.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ (සිංහල) පරීක්‍ෂණය—1960වේ අප්‍රේල්

වර්ෂ 1960වේ අප්‍රේල් මස 23 වැනි දින පවත්වනු ලැබූ ඉහත සඳහන් පරීක්ෂණයට පෙනී සිටි අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් කිසිවෙක් ඔවුන් විසින් පෙනී සිටි කිසිම විෂයයකින් සාමාර්ථය ලබා නැති බැව් මෙයින් දනුම් දෙමි.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දීය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1-පහත සඳහන් සේවයන් සඳහා 1960 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

1. ගැල්වනයිස් වානේ තහඩු සහ ගැල්වනයිස් වානේ පීලි සහිත තහඩු සැපයීම.
2. ඝන පිදුරු කඩදාසි. සැපයීම.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩරකරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

එක් එක් සේවය සම්බන්ධයෙන් රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ ඕනෑම කච්චේරියක හෝ බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 සැප්තැම්බර් 12 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩරකරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. එක් එක් සේවය සම්බන්ධයෙන් රු. 100ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බව්ට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර පෝරම කොළදැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ශ්‍රී. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූනි 17 වනිදා,
කොළඹදීය.

## රාජකීය ලංකා නාවික හමුදාව

1960.10.1 වැනි දින සිට අවුරුද්දක් තුළ, ත්‍රිකුණාමලයෙහි නාවික හමුදාවට වියලි ආහාර ද්‍රව්‍ය සිල්ලර බඩු යනාදිය සැපයීම සඳහා ද, කොළඹ, දියතලාව, කරෙයිනගාර් සහ ත්‍රිකුණාමලයෙහි රාජකීය ලංකා නාවික හමුදාවට එළවළු, පලතුරු, මස්, මාළු, බිත්තර කරවල සැපයීම සඳහා ද, 60.7.12 වැනි දින පෙ. ව. 9.30 දක්වා රාජ්‍ය ආරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් වෙනම ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් එවිය යුත්තේ, නාවික හමුදාධිපති ගෙන් ඉල්ලුම් පතකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයක ය. සියලු විස්තර ද ඔහු ගෙන් ම ලබා ගත හැක.

ටෙන්ඩර් පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම එක් ටෙන්ඩරයකට රු. 25ක මුදලක්, නාවික හමුදා මූලස්ථානයෙහි තැන්පත් කළ යුතුයි. කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, සියලු ම තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

1960 ජූලි මස 8 වැනි දින, දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජී. ආර්. ඇම්. ද මැල්,
නාවික හමුදාධිපති.

රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ.

---

## රාජකීය ලංකා නාවික හමුදාව

1960.10.1 වැනි දින සිට අවුරුද්දක් තුළ කොළඹ, දියතලාව, කරෙයිනගාර් සහ ත්‍රිකුණාමලයෙහි රාජකීය ලංකා නාවික හමුදාවට පාන්, ඉදිආප්ප, රොටි ආදිය සැපයීම සඳහා නාවික හමුදාධිපති විසින් 60.7.12 වැනි දින පෙ. ව. 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් එවිය යුත්තේ නාවික හමුදාධිපති ගෙන් ඉල්ලුම් පතකින් ලබා ගත හැකි ආකෘති පත්‍රයක ය. සියලු විස්තර ද ඔහු ගෙන් ලබා ගත හැකි.

ටෙන්ඩර් පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම එක ටෙන්ඩරයකට රු. 25ක මුදලක් නාවික හමුදා මූලස්ථානයෙහි තැන්පත් කළ යුතුයි. කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, සියලු ම තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

1960 ජූලි මස 8 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජී. ආර්. ඇම්. ද මැල්,
නාවික හමුදාධිපති.

රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1960-61 මුදල් වර්ෂය තුල යාපනයේ බන්ධනාගාරයට (1) මාදම්පේ වේවැල් (2) ඇට කෙඳි (බ්‍රිස්ටල් පයිබර්) සහ (3) පොල් කටු අඟුරු සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර වර්ෂ 1960 ක් වූ ජූලි මස 11 වෙනි සඳුදා පෙරවරු 9.30 වන තෙක් මෙහි පහත අත්සන් තබන අය විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර දැමිය යුත්තේ, කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්යාලයේ හෝ කොළඹ හැර වෙන කච්චේරියක හෝ එක් වර්ගයකට රුපියල් 10 බැගින් තැන්පත් කර ලබාගත හැකි කුවිතාන්සිය, මෙහි පහත අත්සන් කරන අයට පෙන් වූ විට, ලබා ගත හැකි පෝර්ම කොලවලය.

ටෙන්ඩර් පත්‍ර සීල් තබන ලද කවරයක බහා, ටෙන්ඩර්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිලිවෙලත් තමා කරන්නට යන සේවය සම්බන්ධව වැඩි විස්තරත් කවරයේ වම් පැත්තේ උඩ කෙලවරේ සඳහන් කොට, මෙහි පහත අත්සන් තබන අය වෙත යැවිය යුතුයි.

මෙහි පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ දී වර්ෂ 1960 ක් වූ ජූලි මස 11 වෙනි සඳුදා පෙරවරු 9.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ අයට එහි සිටීමට අවසර තිබේ.

වැඩි විස්තර මෙහි පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැක.

ඊ. සී. ප්‍රේමතිලක,
වැඩ බලන සහකාර බන්ධනාගාර අධිකාරී තැන.
යාපනය.

වර්ෂ 1960 ක් වූ ජූනි මස 3 වෙනි දින,
යාපනයේ බන්ධනාගාරයේ දීය.

## 1959-60 වර්ෂයේ මහර බන්ධනාගාරයට දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම

පහත අත්සන් කරන අය විසින් රාගම මහර බන්ධනාගාරයට 1960 ජූලි 1 වෙනි දින සිට 1960 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා කාලය තුල දෙවෙනි කොහු හා ගුදිරි කොහු සැපයීම සඳහා 1960 ජූනි මස 30 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(අ) දෙවෙනි කොහු සහ ගුදිරි කොහු සඳහා අය කරන මිළ ගණන් වෙන වෙනම එකම ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුයි.

(ආ) මුද්‍රා තබන ලද සැම්පල් වෙන වෙනම මහර බන්ධනාගාරයේ අධිකාරී තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පමණක් ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

පහත අත්සන් කළ අය වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලබාගන්නා මුද්‍රිත පත්‍රවල ටෙන්ඩර් සඳහන් කළ යුතුයි. රුපියල් 10ක් මහර බන්ධනාගාර කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ඉල්ලුම්පතක් ලබාගත හැක. නියම කරන මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයේ අකුරෙන් සහ අංකවලින් දක්විය යුතුයි.

දෙවෙනි කොහු සහ ගුදිරි කොහු සැපයීම සඳහා රෙජිස්ටර් තැපෑලෙන් එවන හෝ මහර බන්ධනාගාරයේ තබා තිබෙන ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ තැන්පත් කරන සියලුම ටෙන්ඩර් පත්‍ර ඇතුළත් කවරයේ දකුණු කෙළවරේ ඉහළ "දෙවෙනි කොහු සහ ගුදිරි කොහු සැපයීම" කියා සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ නියමිත වේලාව ඉකුත්වූ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ එහි පැමිණිය හැක.

ඊ. ඇල්. ප්‍රනාන්දු,
අධිකාරීතැන.

මහර බන්ධනාගාරය,
රාගම, 9.6.1960.

---

## වර්ෂ 1960 ක්වූ ජූලි මස 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා යාපනයේ බන්ධනාගාරයේ ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණු කසල මිළදී ගැනීම යි

වර්ෂ 1960 ජූලි මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා යාපනයේ බන්ධනාගාරයේ ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණු කසල මිළදී ගැනීම පිළිබඳ ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. දිනපතාම පස්වරු 3 ට පෙර කුණු කසල රැගෙන ගිය යුතුයි.

3. වර්ෂ 1960 ක්වූ ජූනි මස 24 වෙනි සිකුරාදා පෙරවරු 9.30 වන තෙක්, සීල් තබන ලද, "ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණු කසල මිළදී ගැනීම පිළිබඳ ටෙන්ඩර් පත්‍ර" යන්න කවරයේ පිට පැත්තේ සඳහන් කර තිබිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර යාපනයේ බන්ධනාගාරයේ වැඩබලන අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ වර්ෂ 1960 ජූනි 24 වැනි දින පෙරවරු 9.35 ට යාපනයේ වැඩබලන බන්ධනාගාර අධිකාරි තැනගේ කාර්‍යාලයේදී ය. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට එහි පෙනී සිටීමට අවසර තිබේ.

5. මේ පිළිබඳව වැඩි විස්තර යාපනයේ වැඩබලන බන්ධනාගාර අධිකාරී තැනගෙන් දැනගත හැක.

බී. ජේ. ඇස්. ද ඉසඩ්. ආබිහෙට්ටි,
වැඩබලන අධිකාරී තැන.

යාපනයේ බන්ධනාගාරය,
1960 ජූනි මස 17 වෙනි දින දීය.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම

1960 ඔක්තෝබර් මස 1 වැනි දිනෙන් පටන් ගැනෙන, එක් අවුරුදු කාලසීමාවක් සඳහා පහත දක්වෙන සේවාවන් ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සඳහා කැඳවනු ලබන ටැන්ඩර් පත්‍ර, 1960 ජූලි මස 13 වැනි බදාදා දහවල් 12 දක්වා, සුරාබදු කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ :—

(i) මහනුවර සුරාබදු ගුදම් සහ දුම්රිය බඩු ගබඩාව ;

(ii) බදුල්ලේ සුරාබදු ගුදම සහ දුම්රිය බඩු ගබඩා ;

(iii) (අ) යාපනයේ සුරාබදු ගුදම සහ රේගුවේ දුම්රිය බඩු පටවන ස්ථානය ; හා



(ආ) යාපනයේ සුරාබදු ගුදම සහ දුම්රිය බඩු ගබඩාවද— අතර අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම.

2. සුරාබදු කොමසාරිස් තැන ගෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි ෆෝර්මවල ටැන්ඩර් එවිය යුතු අතර, කාරණයට අදාල සියළුම විස්තර ද එම නිලධාරිතැනගෙන් අසා දැනගත හැක.

ජී. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස් තැන.

සුරාබදු කොමසාරිස්තැනගේ කාර්යාලය,
සැවොයි ගොඩනැගිල්ල, වැල්ලවත්ත, කොළඹ 6,
1960.6.2.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම සඳහා ටැන්ඩර්— කළුතර සුරාබදු ගුදම්

1960 ඔක්තෝබර් මස 1 වැනි දිනෙන් පටන් ගැනෙන එක් අවුරුදු කාලසීමාව තුළදී, කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුවේ දුම්රිය බඩු ගබඩාව සහ සුරාබදු ගුදම් සහ එම දුම්රිය බඩු ගබඩා ද අතර, අරක්කු සහ වෙනත් බඩු එහා මෙහා ගෙනයාම පිණිස කැඳවනු ලබන ටැන්ඩර් පත්, වර්ෂ 1960 ජූලි මස 6 වැනි දින දවල් 12 දක්වා කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

සුරාබදු කොමසාරිස් තැන ගෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි ෆෝර්ම වල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, කාරණයට අදාළ සියළුම විස්තරද එම නිලධාරි තැනගෙන් අසා දැනගත හැක.

ජී. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස් තැන.

සුරාබදු කොමසාරිස්තැනගේ කාර්යාලය,
සැවොයි ගොඩනැගිල්ල, වැල්ලවත්ත, කොළඹ 6,
1960.6.2.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර, මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 10 වනතුරු, මෙම දෙපාර්තමේන්තුවේ, පිළිවලින් රුපියල් 20,000 හා රුපියල් 10,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන්, හසලක කුඩා වැවේ ප්‍රවේශ සහ පිටවීමේ වාන්වලට, ඔසවන ගියරය (Lifting gear) ආදියෙන් යුත් වාත්තුකළ වානේ වාන් දොරවු සහ හසලක කුඩා වැවේ වානට ඔසවන ගියරයෙන් යුත් (Lifting gear) වාත්තුකළ වානේ වාන් දොර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර, ප්ලෑන් පරීක්ෂාකිරීම් හා වෙනත් කරුණු දැනගත හැකි වේරගංතොට, හසලක උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන වෙතින් ලබාගත් ෆෝරම්වල අනු පිටපතින් විය යුතුයි.

3. වේරගංතොට, හසලක උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත හෝ මහනුවර කච්චේරියේ තැන්පත් කළ රු. 25කට ලබාගත් රිසිට් පතක් හා සුදුසුකම් පිළිබඳ සහතික ඉදිරිපත් කරන අයට, 1960 ජූනි මස 20 වෙනි සඳුදා සිට 1960 ජූලි මස 11 වෙනි සඳුදා දක්වා, ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරගෙන යන කොන්ත්‍රාත්කරුවන්, ඒ ඒ වැඩ සතුටුදායක ලෙස කරගෙන යන බවට වැඩපළවල් භාර නිලධාරීන් ගෙන් ලබාගත් සහතික ටෙන්ඩර් ෆෝරම් ඉල්ලීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. මහනුවර, පරන කච්චේරි ගොඩනැගිල්ලෙහි පිහිටි, ප්‍රාදේශීය වාරිමාර්ග කාර්‍යාලයේදී, මහනුවර, මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් 1960 ජූලි මස 13 වෙනි බදාදා පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවේ පැමිණ සිටීමට බලාපොරොත්තුවන ටෙන්ඩර්කරුවනට ඒ සඳහා අවසර ඇත.

6. ටෙන්ඩර් කැඳවීමේ අවසාන දින සිට සති තුනක් ගෙවෙන තුරු සෑම ටෙන්ඩර්කරුවනගේම ඉල්ලීම් විවෘතකර තැබීම බලාපොරොත්තු වේ.

7. වැඩිපුර විස්තර ගැන වේරගංතොට, හසලක උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ඉල්ලා සිටින්න.

හසලක උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්‍යාලය,
හසලක උප කොට්ඨාශය,
වේරගංතොට, 1960.6.7 දින දීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වව්නියාවේ උතුරු දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් මන්නාරම් උප වාරිමාර්ග කොට්ඨාශයේ තම්පනකුලම් ව්‍යාපාරය අළුත්වැඩියා කෙරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 ජූලි මස 5 වෙනි දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ. මන්නාරමේ ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි.

වැඩ පිළිබඳ විස්තර මන්නාරමේ ඉංජිනේරු තුමාගෙන් දැනගත හැක. පැලැන් ඔහුගේ කාර්යාලයේදී බලාගත හැක. ඕනෑම කච්චේරියක් හෝ මුරුන්කමේ වාරිමාර්ග කාර්යාලයේ හෝ රු. 50ක් තැන්පත් කර කුවිතාන්සියක් සමග තමා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වන බව ඔප්පු කර වන අය වළුන්ට පමණක් ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. රු. 40,000ට සහ ඊට ඉහළ ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර්වලට සුදුස්සෝ වෙති.

ඩී. ජී. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
උප කොට්ඨාශය, මන්නාරම.

මුරුන්කන්, 9.6.60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොණරාගල වාරිමාර්ග උප කොට්ඨාශයේ ලුනුගල යෝදවැවේ වම් ඉවුරේ අඩි 120ක සොරොව්වක් සෑදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 6.7.60 වෙනි දින පෙරවරු 10ය වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සමන්විත විය යුතුයි. අවශ්‍ය ෆෝරම මොණරාගල උප කොට්ඨාශය භාර වාරිමාර්ග නිලධාරි තැනගෙන් ලබාගත හැක. තවත් වැඩි විස්තර ආදියද ඔහුගෙන්ම ලබාගත හැකි අතර මේ සඳහා ඇති සැලසුම් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

3. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් බව ඔප්පු කළ හැකි හා රුපියල් 25ක් කච්චේරියක හෝ වාරිමාර්ග කාර්යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 5.7.60 වෙනි දින තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

ඕ. ඇස්. චන්ද්‍රරත්න,
උ. කො. භා. වා. මා. නිලධාරිතැන,
මොණරාගල.

1960 ජූනි 9 වෙනි දින,
බණ්ඩාරවෙල.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්ෂ 1960ක්වූ ජූනි මස 22 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| මෙහෙය පිළිබඳ විස්තර | ලියාපදිංචි කොට ඇති ප්‍රමාණය | ටෙන්ඩර් තැන්පත් මුදල |
| --- | --- | --- |
| උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරයේ දකුණු ඇලෙහි යෝජිත හරස් අතුර ඉදිකිරීම (Overcrossing trough) | ... 50,000 0 ... | 50 0 |

2. ඉහත සඳහන් මෙහෙයනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000කට හෝ ඊට වැඩි ගණනකට හෝ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර් දැමීමට සුදුස්සෝ වෙති.

3. ටෙන්ඩර් පත්‍රය තඹුත්තේගම රාජාංගන උප කොට්ඨාශයෙහි වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා අවශ්‍ය වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර වර්ෂ 1960ක්වූ ජූනි මස 17 වැනි දින සිට වර්ෂ 1960ක්වූ ජූනි මස 21 වැනි දින දක්වා කාර්යාලීය වැඩ කරන කාලය තුළදී මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

පී. ආර්. ද සිල්වා,
රාජාංගන උප කොට්ඨාශයෙහි වාරිමාර්ග ඉංජිනේරුතැන.

වාරිමාර්ග කාර්යාලය,
තඹුත්තේගම, 1960.6.1

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### මෙරට තල විකිණීම

පහත විස්තර සඳහන් 1959 අස්වැන්නෙන් ලබාගත් තල ටොන් දෙසියපනහක් (250) පමණ විකිණීම පිණිස තිබේ. ඒ සඳහා මිල ගණන් ගොවිජන සේවා කොමසාරිස් තුමා විසින් වර්ෂ 1960ක්වූ ජූනි මස 30 වෙනි දින අ.භා. 3 වනතෙක් භාරගනු ලැබේ. මරදානේ නියමිත මිල යෝජනා ක්‍රම ගබඩාවේ (විජේපාලි වෙළඳ සැල ඉදිරිපිට) ප්‍රධාන ගබඩා භාරකරුගෙන් ඉල්ලූම් කළවිට මේ තල තොගය පරීක්ෂා කර බැලිය හැක. (ටෙලිෆෝන් අංකය 5,216).

2. විස්තර : දුඹුරු සහ සුදු ඇට මිශ්‍ර ලංකාවේ කළු තල, අන් ද්‍රව්‍ය 3%කට වඩා කලවම් නැත. තල ඇටවල අඩංගු තෙල් ප්‍රමාණය 47%කට වඩා අඩු නැත. මේ තල හොඳ තත්වයේ තනි ගෝනිවල අසුරා තිබේ.

3. කවරයේ උඩ වම් කෙළවරේ "තල මිලදී ගැනීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර කොළඹ 7හේ ඇඩින්බරෝ චන්ද්‍ර වංකයෙහි අංක 42 දරණ [illegible]යෙහි ගොවිජන සේවා කොමසාරිස් තුමාගේ කායභාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක. නැතහොත් තැ.පෙ. අංක 537, කොළඹ 7 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. ඉල්ලුම්කරුවන් විසින් තමන් ගැනීමට බලාපොරොත්තුවන ප්‍රමාණය ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

5. වැඩි විස්තර තැ.පෙ. අංක 579, කොළඹ 10, ගොවිජන සේවා කොමසාරිස් තුමාගෙන් දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960.6.10.
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10,

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කවුඩුල්ල ව්‍යාපාරයේ රොටවැවේ ඕවර්සියර් නිවාසයක් සෑදීම

1960.6.3 වැනි දින දරණ ගැසට් පත්‍රයෙහි 23.5.60 දනමින් පළ වූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන දිනය 7.6.60 දින සිට 20.6.60 වැනි දින දක්වා ද ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1960 ජූනි මස 22 වැනිදා වන තෙක් ද දීර්ඝ කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ඕ. ඒ. ගුණවර්ධන,
උප වාරිමාර්ග ඉංජිනේරු තැන,
කවුඩුල්ල උප. කොට්ඨාශය.

1960 ජූනි මස 9 වැනි දින දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කවුඩුල්ල ව්‍යාපාරයේ මින්නේරියේ ඕවර්සියර් නිවාසයක් සෑදීම

1960.6.3 වැනි දින දරණ ගැසට් පත්‍රයෙහි 23.5.60 දනමින් පළ වූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන දිනය 7.6.60 දින සිට 20.6.60 වැනි දින දක්වා ද ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1960 ජූනි මස 22 වැනිදා වන තෙක් ද දීර්ඝ කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ඕ. ඒ. ගුණවර්ධන,
උප වාරිමාර්ග ඉංජිනේරු තැන.
කවුඩුල්ල උප කොට්ඨාශය.

1960 ජූනි මස 9 වැනි දින දීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—සෞඛ්‍ය ඉංජිනේරු අංශය

ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමන් විසින් පහත සඳහන් කර්මාන්තයන් සඳහා පිටපතක් සහිත වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1960 ජූලි මස 12 වැනි කුජදා උදේ 10 වන තෙක් භාරගනු ලැබේ :—

කතරගම ආරෝග්‍යශාලාවේ විදුලි යන්ත්‍රය සවිකිරීම සඳහා ගොඩනැගිල්ලක් සෑදීම.

2. ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා විසින් 1960 ජූනි මස 29 වැනි සිකුරාදා සවස 4 වනතෙක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ රුපියල් 7,000 වඩා වටිනාකමැති ගොඩනැගිලි කර්මාන්තයන් සඳහා රජයේ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා . නමින් කොළඹ ලංකා බැංකුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ටොරින්ටන් චතුරශ්‍රයේ තැ. පෙ. 1434, ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිළධාරිතුමාට භාර දිය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාර ගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පූරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවෙල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
13.6.60.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### මහනුවර වටපුලුව නිවාස ක්‍රමය සඳහා ඇතුල් පාරවල් තැනීම

1960.5.27 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960.5.23 දතමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 ජූනි මස 29 වෙනි බදාදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස්තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544, කොළඹ 2,
1960 ජූනි මස 7 වෙනි දින.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නාවල, අඹගහවත්ත "බී" වර්ගයේ ගෙවල් 2ක් තැනීම

1960.5.13 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960.5.4 දතමින් පළ වූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 ජූනි මස 29 වෙනි බදාදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544, කොළඹ 2.
1960 ජූනි මස 10 වෙනි දින,

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කොළඹ, ජාතික නිවාස දෙපාර්තමේන්තු කාර්යාලයෙහි ඉංජිනේරු අංශය නැවත බෙදා වෙන් කිරීම

කොළඹ, ජාතික නිවාස දෙපාර්තමේන්තු කාර්යාලයෙහි ඉංජිනේරු අංශය නැවත බෙදා වෙන් කිරීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 1 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 25 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූනි මස 29 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.
1960 ජූනි මස 9 වැනි දින.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### දඹුල්ලේ 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං එකක් තැනීම

දඹුල්ලේ 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 20ක් සහ ළිං එකක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූලි මස 15 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 90,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 90 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූලි මස 13 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.
1960 ජූනි මස 9 වැනි දින.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

(අ) උඩරට, (ආ) උතුරු, (ඇ) තලෙයිමන්නාරම සහ (ඈ) මඩකලපුව යන මාර්ගයන්හි 3 වෙනි පංතියේ ගමනාගමනය කරන මගීන් උදෙසා 1960 ඔක්තෝබර් මස 1 වෙනි දා සිට එක් අවුරුද්දක, දෑ අවුරුද්දක හා තුන් අවුරුද්දක කාල සීමාවන් සඳහා ආහාර පානාදිය විකිණීමේ වරප්‍රසාදයන් සඳහා ලියා පදිංචිවූ ගැනුම් යෝජනාකරුවන්ගෙන් 1960 ජූලි මස 13 වෙනි බදාදා දවල් 12 වනතුරු කොළඹ, තැ. පෙ. 355 දුම්රිය සාමාන්‍යාධිකාරි තුමාගේ කාර්යාලයෙහි ගැනුම් යෝජනා පත් මණ්ඩලයේ සභාපති තුමා විසින් ගැනුම් යෝජනා පත් භාර ගනු ලැබේ.

දුම්රිය වාණිජ අධිකාරි තැනගේ කාර්යාලයෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ගැනුම් යෝජනා පත් පිළියෙළ කොට අනුපිටපතක් ද සහිතව එවිය යුතුය. ගැනුම් යෝජනා පත්‍ර සඳහා තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 500 ක් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කළ විට 1960 ජූලි මස 9 වෙනි සෙනසුරාදා දවල් 12 වනතුරු ගැනුම් යෝජනා ෆෝර්මයන් ලබාගත හැක.

"විශෙෂ" සහ "සාමාන්‍ය" විස්තර ප්‍රකාශණයන් සමග මෙම පත්‍රිකාවද ගැනුම් යෝජනා පත්‍ර සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කොළඹ තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරි තුමාගේ කාර්යාලයේ "ගැනුම් යෝජනා පත්‍ර මණ්ඩලයේ" සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ගැනුම් යෝජනාකරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් හෝ දුම්රිය වාණිජ අධිකාරි තැන වෙත ගෙන විත් භාර දිය හැක. එම ලියුම් කවරයෙහි ඉල්ලුම් කරන සේවය, නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. දුම්රිය වාණිජ අධිකාරි තැන එය වහාම ගැනුම් යෝජනා පත්‍ර බහාලන පෙට්ටියේ තැන්පත් කරන

අතර ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ද නිකුත් කරනු ඇත. ඉහත සඳහන් කරන වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන ගැනුම් යෝජනා පත්‍ර භාරගනු නොලැබේ.

ගැනුම් යෝජනා කරුවන් කැමැති නම්, ගැනුම් යෝජනා පත්‍ර විවෘත කරන වේලාවට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. 1960 ජූලි මස 14 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි තැනගේ කාර්‍යාලයේදී එකී ගැනුම් යෝජනා පත් විවෘත කරනු ලැබේ.

තමන් විසින් ඉල්ලුම් කරනු ලබන සේවය, භාර ගැනීම සඳහා ගැනුම් යෝජනා පත්‍ර භාරගැනීමේ අවසන් දිනයේ සිට සති තුනක් ගැනුම් යෝජනාකරුවන් බලාපොරොත්තුවෙන් සිටිය යුතුය.

වැඩි විස්තර වාණිජ අධිකාරි තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

තැ. පෙ. 355, කොළඹ,
1960 ජූනි මස 11 වෙනිදා.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ඇස්බැස්ටෝස් සිමෙන්ති කුහඹු සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහන පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 ජූලි මස 27 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාර ගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොළ වල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 ජූලි මස 23 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ජනසතු සේවා නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූනි මස 13 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹ දීය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ගෙනයා හැකි ඩීසල් පොම්ප කිරීමේ උපකරණ සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 ජූලි මස 27 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 ජූලි මස 23 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූලි මස 13 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදීය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දෙවරක් තම්බා පිරිසිදු කරන ලද ලයිනෝරු තෙල් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය : තැ. පෙ. 547, කොළඹ 1) 1960 ජූලි මස 27 වැනි බදාදා දහවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1960 ජූලි මස 23 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1960 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10ට ජනසතු සේවා, නැව් සහ ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.
වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

සැ. ඔ. පෙ. රූපසිංහ,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1960 ජූලි මස 13 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹදීය.

---

## නිවාස වයර් කරන් කේබල් කම්බි සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොළොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්‍ෂ 1960ක්වූ අගෝස්තු මස 17 වන බදාදා දවල් 12 දක්වා තැපැල් වැඩ සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වන රු. 5 හෝ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වර්‍ෂ 1960ක්වූ අගෝස්තු මස 12 වන දින වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්‍ෂ 1960ක්වූ අගෝස්තු මස 18 වෙනි බ්‍රහස්පතින්ද පූ. භා. 10ට තැපැල් වැඩ සහ විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්‍යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1960ක්වූ ජූනි මස 17 වෙනි දින දීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා නැව් කටයුතු හා ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 ජූලි මස 6 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා වැඩිමණත් වානේ බත්තල් 26ක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1960 ජූලි මස 6 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ බවට එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

12. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කොළඹ දිසාපති තුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් පිට ටෙන්ඩර් බාරගන්නා ලද අවසාන දිනයේ සිට සති (3) තුන ඇතුළතදී ටෙන්ඩරය බාරගැනීම බලාපොරොත්තු විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය බාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත පොල්වලට ගෙවා ඉවත් කර ගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

16. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැනගෙන් හෝ මීගමුවේ ප්‍රාදේශීය ආදායම් පාලක තැන ගෙන් දැන ගත හැක.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ කච්චේරියේ දීය.

---

## දිසාපති තැන—කළුතර දිස්ත්‍රික්කය

### ගම් විශාල කිරීමේ සහ මධ්‍යම පංති ඉඩම් කට්ටිවලට පිවිසෙන මාවත් වල පස් වැඩ, බෝක්කු සෑදීම ආදි වැඩ කොටස් කොන්ත්‍රාත් දීම

කළුතර දිසාපති තැන විසින් පහත සඳහන් මාවත් සෑදීම සඳහා මුද්‍රා තබන ලද ටැන්ඩර් පත්‍ර 1960 ජූලි මස 4 වන දින පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ :—

| පාරේ නම | කළ යුතු වැඩ | පිහිටීම |
|---|---|---|
| 1. කෙවිටියාගල පහසු ක්‍රමයේ ඉඩම් සහ මධ්‍යම පංති ඉඩම්වලට පිවිසෙන මාවත | I. පළමුවන සැතපුමේ පළමුවන භාගය—පස්වැඩ, ගල් කැඩීම සහ බෝක්කු සෑදීම ආදිය ... ... | නැගෙනහිර පස්දුන් කෝරළය |
| | II. 1 මුවන සැතපුමේ 2 වන භාගය—පස්වැඩ, ගල්කැඩීම, සහ බෝක්කු සෑදීම ආදිය ... ... | එම |
| | III. 2 වෙනි සැතපුමේ 1 වන භාගය—පස්වැඩ, ගල්කැඩීම සහ බොක්කු සෑදීම ආදිය ... ... | එම |
| | IV. 2වෙනි සැතපුමේ 2වෙනි භාගය—පස්වැඩ, ගල්කැඩීම සහ බෝක්කු සෑදීම ආදිය ... ... | එම |
| 2. පැලවත්ත—මොරවක සිට අතලේ පාර, 3 වන සැතපුම | I. කැලෑ එළිකිරීම, පස්වැඩ සහ ගල්කැඩීම ... | එම |
| | II. බොක්කු සෑදීම ... ... | එම |
| | III. පාලමක් සෑදීම ... ... | එම |
| 3. පැලවත්ත—බෝතලාව රිදී විට පාර ... | I. 1 වන සැතපුමේ 1වෙනි භාගය —පස්වැඩ, ගල්කැඩීම ආදිය | එම |
| | II. 1 වන සැතපුමේ 2වෙනි භාගය—පස්වැඩ, ගල්කැඩීම ආදිය | එම |
| | III. 1 වන සැතපුමේ බෝක්කු සෑදීම ... | එම |
| | 2වෙනි සැතපුමේ 1වන භාගය ... | එම |
| | 2වෙනි සැතපුමේ 2වන භාගය ... | එම |
| | 2වෙනි සැතපුමේ, බෝක්කු සෑදීම ආදිය ... | එම |
| 4. පැලෑද—බෝතලාව පහසුක්‍රමයේ ඉඩම්වලට පිවිසෙන මාවත | I. පස්වැඩ, බෝක්කු සෑදීම ආදිය ... | එම |
| 5. පරෙයිගම මධ්‍යම පන්ති සහ ගම් පළල් කිරීමේ ඉඩම්වලට පිවිසෙන මාවත 1වන වැඩ කොටස | I. පස්වැඩ ආදිය ... | බටහිර පස්දුන් කෝරළය |
| | II. බෝක්කු සෑදීම ... | එම |

ඉහත සඳහන් එක් එක් වැඩ කොටස සඳහා කළුතර කච්චේරියෙන් ලබාගත් ටැන්ඩර් පත්‍රිකාවකින් ඉල්ලුම් කළ යුතුයි. ටැන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ කළුතර කච්චේරියේ රුපියල් 50 ක මුදලක් තැන්පත්කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. 1960 ජූලි මස 2 වන දින තෙක් ටැන්ඩර් පත්‍රිකා නිකුත් කරණු ලැබේ. නියමිත ටැන්ඩර් පත්‍රිකාවෙන් මිස වෙන අන්කිසි ක්‍රමයකින් ඉදිරිපත් කරනු ලබන ටැන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

1960 ජූලි මස 4 වන දින පෙරවරු 10ට කළුතර කච්චේරියේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ඒ අවස්ථාවේදී ටැන්ඩර් ඉල්ලුම්කරුවන්ට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

කළ යුතු වැඩ පිළිබඳව කොන්දේසි හා ඇග්‍රිමේන්තු ආදිය ගැන වැඩි විස්තර කාර්‍යාලය විවෘත කර තිබෙන කාලය තුළදී කළුතර කච්චේරියේදී දැනගත හැක.

කච්චේරිය,
කළුතර, 1960.6.13.

වී. පතිරණ,
දිසාපති,
කළුතර දිස්ත්‍රික්කය.

---

අංකය අයි/ඕඑච්පී 649/5.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුලු වාරිකම් වැඩ

පහත දක්වන සුලු වාරිකම් වැඩ සඳහා මෙම කච්චේරියෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1960 ජූනි මස 29 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

(1) ඔලිදලුව වැව අලුත්වැඩියා කිරීම

(2) හල්මිල්ලෑව—මහවැව.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 ජූනි මස 28 වැනි දින පස්වරු 3 වනතුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබාගත හැක. සමූපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා පත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 ජූනි මස 29 වැනි දින පෙරවරු 10 ට පටන් ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම් කරුවන්ටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබා ගත හැක.

වී. කේ. රාජරත්නම්,
පුත්තලමේ දිසාපති වෙනුවට.

1960 ජූනි මස 10 වැනි දින,
පුත්තලම්, කච්චේරියේ දීය.

